# තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

## යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

## ජාතික වෘත්තීය සුදුසුකම් පිළිබඳව (NVQ) ඇගයීම්කරුවන් ලියාපදිංචි කිරීම මට්ටම් 5 - 6

ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ ක්‍රමය යටතේ මට්ටම් 5 සහ 6 වන ඩිප්ලෝමා සඳහා නිපුනතා පාදක ඇගයීම් කිරීමට පුහුණුවීම හා ලියාපදිංචිවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පුහුණුව සාර්ථකව අවසන්කර ලියාපදිංචි කරනු ලබන ඇගයීම්කරුවන් පැවරුම් පදනම මත අදාල විෂය ක්ෂේත්‍රයේ ඇගයීම් කිරීමට අවශ්‍ය පරිදි යොදාගැනේ.

<u>සුදුසුකම් හා පළපුරුද්ද</u>

01. අදාල ක්ෂෙත්‍රයෙහි පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීමය ආයතනයකින් පිරිනමනු ලබන ඒ හා සමාන සුදුසුකමක් සමඟ වෘත්තීයට අදාලව අධීක්ෂක /කළමණාකරන මට්ටමේ වසර 3 ක සේවා පළපුරුද්ද.

02. අදාල ක්ෂෙත්‍රයෙහිලා වූ අවම වශයෙන් වසර 2ක පූර්ණකාලින ඩිප්ලෝමාවක් සමඟ වෘත්තීයට අදාලව අධීක්ෂක/කළමණාකරන මට්ටමේ වසර 5ක සේවා පළපුරුද්ද.

**නව ඇගයීම්කරුවන් බඳවාගන්නා විෂය ක්ෂේත්‍රයන්**

- විදුලි සංදේශ තාක්ෂණය
- මෙකාට්‍රොනික්ස් තාක්ෂණය
- ඉදිකිරීම් තාක්ෂණය
- මෝටර් රථ තාක්ෂණය
- ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණය
- කෘෂි යන්ත්‍රෝපකරණ තාක්ෂණය
- ජීව වෛද්‍ය උපකරණ තාක්ෂණය
- තොරතුරු හා සංනිවේදන තාක්ෂණය
- පෑස්සුම් තාක්ෂණය
- ආහාර තාක්ෂණය
- ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණය
- නිෂ්පාදන තාක්ෂණය
- සංඛ්‍යාංක ප්‍රතිබිම්බකරණය හා මුද්‍රණ තාක්ෂණය

මෙම ක්ෂේත්‍රයන් සඳහාද සුදුසුකම් ඇති දැනටමත් සහතිකපත්‍ර මට්ටමේ ඇති වෘත්තීන් ඇගයීම සඳහා ලියාපදිංචි වී ඇති ඇගයීම්කරුවන් මෙම ක්ෂේත්‍රයන් පිළිබඳවද උනන්දුවක් දක්වන්නේ නම් නැවත ඉල්ලුම් කලයුතුය.

<u>අයදුම් කල යුතු ආකාරය</u>

- www.tvec.gov.lk දරණ කොමිෂන් සභා වෙබ් අඩවියෙන් හෝ කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි අයදුම්පත්‍රය සම්පූර්ණකල යුතුය. අයදුම්පත පිළිබඳව කටයුතු කිරීමේ ගාස්තුව වන රු. 250/- ක මුදල ඉල්ලුම්පත සමඟ ඉදිරිපත්කල යුතුය.

- සම්පූර්ණ කරනලද අයදුම්පත් එවියයුතු ලිපිනය:
  නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (ජාතික වෘත්තීය සුදුසුකම්),
  තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
  නො. 354/2, ඇල්විටිගල මාවත,
  නාරාහේන්පිට,
  කොළඹ 05.

  අයදුම්පත් එවන ලබන ලියුම් කවරයෙහි වම් ඉහළ කෙළවරේ ''NVQ ඇගයීම්කරුවන් 5, 6 මට්ටම්'' ලෙස සඳහන් කලයුතුය.

- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල ස්ථිර සේවාදායකයින් ලෙස දැනට කටයුතුකරන අය ඔවුන්ගේ ඉල්ලුම්පත් අදාල ආයතන ප්‍රධානීන් මඟින් යොමුකල යුතුය.

  පැහැදිලිකර ගැනීම් හා වැඩිවිස්තර, 011-2555046 අමතා නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (ජාතික වෘත්තීය සුදුසුකම්) මඟින් ලබාගත හැක.

**අධ්‍යක්‍ෂ ජනරාල්**
**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
නො. 354/2, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.